

# ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා හානිපූරණය

'හානිපූරණය' යන වචනය බිහිවූයේ *'reparō'* යන ලතින් වචනයෙනි

ප්‍රකෘතිමත් කිරීම හෝ සකස් කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ක්‍රියාව

## හානිපූරණ යනු කුමක්ද?

හානිපූරණය යනු වරදක් හෝ වැරදි ක්‍රියාවක් නිවැරදි කිරීම සඳහා යමෙකු කරනු ලබන හෝ ලබාදෙන දෙයකි. යුද්ධ, බරපතල අපරාධ සහ අපයෝජනයන් සඳහා වරද පිරිමැසීමක් ලෙස රජයන් විසින් හානිපූරණය කරනු ලැබේ.

හානිපූරණය මඟින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූ පුද්ගලයන්ගේ හා ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ප්‍රකෘතිමත් කිරීමට උත්සාහ කරන අතර එම අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් නිසා ඇති වන පීඩාවන්ට විසඳුම් සෙවීමෙන් වින්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ රාජ්‍ය පිළිගැනීමක් ලබා දෙයි.

උල්ලංඝණය කිරීමේ බරපතලකම මත පදනම්ව වින්දිතයාට සිදුවන හානිය සඳහා මූල්‍යමය ගෙවීමක් ලෙස වන්දි ලබාදීම




**සංකේතාත්මක හානිපූරණ;**
- ප්‍රසිද්ධ සමා අයැදීම්
- ජාතික සැමරුම් දින
- වින්දිතයන් වෙනුවෙන් මාර්ග නම් කිරීම
- ස්මාරක හා වෙනත් සච්කිරීම් ස්ථාපිත කිරීම
- කෞතුකාගාර සහ මතක උද්‍යාන පිහිටුවීම

උල්ලංඝණය සිදුවීමට පෙර පැවති තත්ත්වයට නැවත පත් කිරීම

**ආපසු ලබාදීම;**
- පුරවැසිභාවය
- රැකියා
- පදිංචිය
- ඉඩම්

**වින්දිතයන් සඳහා සේවා සැපයීමේ ප්‍රතිපාදන;**
- වෛද්‍ය හා මානසික ප්‍රතිකාර
- නෛතික හා සමාජීය සේවා
- ආර්ථික සහාය

**රාජ්‍ය අංශ ප්‍රතිසංස්කරණ;**
- අධිකරණය ශක්තිමත් කිරීම
- නීතිය හා ආරක්ෂක අංශය

*Extracted from* https://www.ohchr.org/en/professionalinterest/pages/remedyandreparation.aspx -



## තනිපුද්ගල හානිපූරණ

තනිපුද්ගල හානිපූරණයන්, නිශ්චිත වින්දිතයන්ට අත්විඳින්නට සිදු වූ නිශ්චිත හානි හඳුනාගනියි. තවත් අයෙකු ඉලක්ක කරගත් අපරාධවල ප්‍රතිඵලයක් ලෙස වක්‍රාකාරව හානිවලින් පීඩාවිදින තනිපුද්ගලයන් වින්දිතයන් ගණයට අයත් වේ.
*උදා: පවුලේ සාමාජිකයෙක්*



## සාමූහික හානිපූරණ

සාමූහික හානිපූරණයන් එකම කලාපයේ හෝ එකම ප්‍රජාවකට බලපාන උල්ලංඝනයන් සඳහා හේතු සහ ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කිරීම සඳහා එකම අනන්‍යතාවය හෝ උල්ලංඝනයන් පිළිබඳ අත්දැකීම් බෙදාහදාගන්නා අය වෙත අවධානය යොමු කරයි



## අධිකරණමය හානිපූරණ

හානිපූරණය සඳහා වන සිවිල් හිමිකම් ඉල්ලීමක වැරදිකරුවෙකුට එරෙහිව වින්දිතයන්ට අපරාධ නඩු පැවරිය හැකිය



## පරිපාලනමය හානිපූරණ

පුළුල්ව ව්‍යාප්ත වූ උල්ලංඝනයන් පිළිබඳ සන්දර්භයකට අදාළ වන අතර උසාවියකට වඩා තනිපුද්ගල හා සාමූහික මානයන් වඩාත් පුළුල් හා පරිපූර්ණ ආකාරයකින් ආමන්ත්‍රණය කළ හැකිය.
*උදා: නිවාස, ඉඩම්, ප්‍රතිෂ්ඨාපනය, තෘප්තිමත්භාවය, පුනුරුත්ථාපනය, සහ යළි සිදුනොවීම පිළිබඳ සහතික වීම*

# හානිපූරණ සැපයීම වැදගත් වන්නේ ඇයි?



හානිපූරණය රජය කෙරෙහි විශ්වාසය ගොඩනගා ගැනීමට මෙන්ම මානව හිමිකම් පිළිගැනීම සහ ආරක්ෂා කරගැනීමට රජයට ඇති හැකියාව තහවුරු කිරීම මඟින් තිරසර සාමයට දායක වේ



හානිපූරණය මඟින්, උල්ලංඝනය වී ඇති පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්පූර්ණ කිරීමට උත්සාහ කරයි




වින්දිතයන්ට ඔවුන්ගේ ශාරීරික හා මානසික තුවාල සුව කිරීමට හා ඔවුන්ගේ ගෞරවය යථාතත්ත්වයට පත් කිරීමට ද්‍රව්‍යමය සහාය හා සංකේතාත්මක පිළිගැනීමක් අවශ්‍ය වේ



මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට ගොදුරු වූවන්ට පිළියමක් සඳහා අයිතියක් ඇති බවට ජාත්‍යන්තර නීතිය හා දේශීය නීතිය විසින් පිළිගනී



වින්දිතයන්ගේ අවශ්‍යතා සඳහා රජය ප්‍රමුඛත්වය ලබාදෙන විට මෙම පිළියම ලබාදීමට ඇති කැපවීම එමඟින් පෙන්නුම් කරන අතර එයින් වින්දිතයන්ට රජය කෙරෙහි විශ්වාසයක් ගොඩනැගෙයි



හානිපූරණය සමාජ සහයෝගීතාව ශක්තිමත් කරන අතර එය රටක දිගුකාලීන ස්ථාවරත්වයට දායක වේ

# හානිපූරණය සඳහා වන කාර්යාලය

*නීතියෙන් පිහිටුවන ලද්දේ 2018 ඔක්තෝම්බර් මාසයේදීය*

## බලතල හා කාර්යභාරය

- හානිපූරණයට සුදුසුකම් ඇති අගතියට පත් වින්දිතයන් හඳුනාගැනීම හා ඔවුන්ට සුදුසු හානිපූරණයක් ලබා දීම
- සන්නද්ධ අරගල, දේශපාලන නොසන්සුන්තා හෝ සිවිල් කෝලාහල සම්බන්ධයෙන් ජීවිත හානි හෝ පුද්ගල හෝ දේපළ හානි සිදුවීම හේතුවෙන් ගැටලු වලට මුහුණදුන් අයට හානිපූරණය ලබාදීම
- අගතියට පත් පුද්ගලයන්ගෙන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් සෘජු අයදුම්පත් ලබාගැනීම
- හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ නිර්දේශ සකස් කිරීම
- අගතියට පත් පුද්ගලයන්ට පරිපාලනමය හා සැලසුම් සේවා සහාය මෙන්ම මානසික සහාය ලබාදීම
- අගතියට පත් පුද්ගලයෙකුට ආරක්ෂාව සැපයීම
- අගතියට පත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා හානිපූරණ ක්‍රියාපටිපාටීන් පිළිබඳ තොරතුරු සහ උපදෙස් ලබාදීම
- අගතියට පත් පුද්ගලයන්ට ආධාර ලබා දීමට පහසුකම් සැලසීම

## අපට ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී හානිපූරණ ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ ඇයි?

- පිරිමින්ට වඩා වෙනස්ව මානව හිමිකම් උල්ලංඝනයන් කාන්තාවන් අත්විඳියි
- දිවිගලවාගත් පිරිමි වින්දිතයන් හා සැසඳීමේදී දේශපාලන/ලිංගික හිංසනයන්ගෙන් දිවි ගලවා ගත් කාන්තාවන්ට ආර්ථික කටයුතුවල යෙදීම සඳහා ඇති අවස්ථා අඩු වීම හා රැකවරණ වගකීම් බහුල වීම නිසා ඔවුන් වඩාත් අසරණ තත්ත්වයකට පත් වේ
- ගැටුම් තත්ත්වයන් තුළ හෝ ඉන් පසුව, කාන්තාවන් තම පවුල රැකබලා ගැනීමේ වගකීම් දරා ගැනීමට සිදු වේ
- කාන්තාවන් වැන්දඹුවන් නම්, ඔවුන්ව ප්‍රජාවන්ගෙන් නෙරපා හැරීමට හෝ තම පවුල්වලින් අතහැර දැමීමට ලක් විය හැක
- එබැවින් හානිපූරණ ක්‍රියාවලිය කාන්තාවන්ට හිමිවන අතර පිරිමි සහ කාන්තා වින්දිත දෙපාර්ශවයටම නිසි පිළිගැනීමක් ලබා දෙනු පිණිස
- එමඟින් අතීතයේ සිදු වී ඇති අපයෝජනයන් සහ එවැනි අපයෝජනයන්හි බලපෑම පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අවබෝධයක් ලබා දෙයි

හානිපූරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීමක් ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලයට බිම් මට්ටමේ දත්ත ලබා දීම

දේශීය භාෂාවලින් කාන්තාවන්ට අදාළ තොරතුරු සැපයීම

කාන්තාවන්, ළමුන් සහ ආබාධිත තත්ත්වයන් සහිතව ජීවිත්වන පුද්ගලයින් ඇතුළු අගතියට පත් පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳව සංවේදී වීම

# රජයේ නිලධාරීන් හානිපූරණය සඳහා කාන්තාවන්ට ප්‍රවේශ වීමට පහසුකම් සපයන්නේ කෙසේද?

අගතියට පත් පුද්ගලයින්ට හානිපූරණය සඳහා වන නිර්දේශ පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

අගතියට පත් පුද්ගලයින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් දැනුවත් කර තබා ගැනීම සහ හානිපූරණය සඳහා කරන ලද අයදුම්පත්වල තත්ත්වය පිළිබඳ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම

අගතියට පත් පුද්ගලයින්, සංවිධාන සහ අගතියට පත් පුද්ගලයින් නියෝජනය කරන බලධාරීන් සමඟ උපදේශන පැවැත්වීම

## හානිපූරණය සඳහා වන කාර්යාලයේ දිස්ත්‍රික් ශාඛා

**යාපනය**
*පුනරුත්ථාපන සහකාර (වැඩ බලන)*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය*
දුරකථන: +94 777 910 856 | +94 212 283 966
ෆී. ඒ. ෆැක්ස්: +94 212 222 355

**මුලතිව්**
*පුනරුත්ථාපන සහකාර*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්*
දුරකථන: +94 772 791 200 | +94 242 290 037/290 033
ෆී.ඒ. ෆැක්ස්: +94 242 290 045

**කිලිනොච්චි**
*පුනරුත්ථාපන සහකාර*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි*
දුරකථන: +94 777 910 856 | +94 212 285 351
ෆී.ඒ. ෆැක්ස්: +94 212 283 966/283

**ත්‍රිකුණාමලය**
*පුනරුත්ථාපන සහකාර (වැඩ බලන)*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය*
දුරකථන: +94 774 670 310 | +94 262 227 027
ෆී.ඒ. ෆැක්ස්: +94 262 222 305/050 905

**මන්නාරම**
*පුනරුත්ථාපන සහකාර*
*මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය*
දුරකථන: +94 774 171 244 | +94 232 250 133
ෆී.ඒ. ෆැක්ස්: +94 232 222 232

**මඩකලපුව**
*පුනරුත්ථාපන සහකාර*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව*
දුරකථන: +94 772 855 183 | +94 652 223 151
ෆී.ඒ. ෆැක්ස්: +94 652 224 466

**වවුනියාව**
*පුනරුත්ථාපන සහකාර*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියා*
දුරකථන: +94 774 927 544 | +94 242 222 212
ෆී.ඒ. ෆැක්ස්: +94 242 222 212

**අම්පාර**
*පුනරුත්ථාපන සහකාර*
*දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර*
දුරකථන: +94 771 319 643 | +94 632 223 904
ෆී.ඒ. ෆැක්ස්: +94 632 222 130/223 904



**හානිපූරණය සඳහා වන කාර්යාලය**
408, ගාලු පාර, කොළඹ 03
විද්‍යුත් තැපෑල: ofrsrilanka2018@gmail.com
දුරකථන: (+94) 112 575 803 | (+94) 112 575 813
ෆැක්ස්: (+94) 112 575 815

IOM UN MIGRATION

Centre for Equality and Justice


**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**
325 ඒ 1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
info@cejsl.org
www.cejsrilanka.org

/Centre-for-Equality-and-Justice
/CEJ_SriLanka
/cej_srilanka
/CEJ Sri Lanka